ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# මාධ්‍ය නිවේදනය

මඩකලපුව දිස්ත්‍රික්කයේ පාසලක උසස් පෙළ පන්තියක අධ්‍යාපනය ලබමින් සිටියදී සියදිවි හානිකර ගත් සිසුවෙකුගේ හිමිකම් සම්බන්ධයෙන් සිවිල් සංවිධානයක් විසින් ගොනු කරන ලද පැමිණිල්ලකට අදාළ පැමිණිලි විභාගය 2022.12.13 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේදී කොමිෂන් සභාවේ සභාපතිනී විනිසුරු රෝහිණී මාරසිංහ මැතිණියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

දරුවාගේ මරණයට වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකාරීත්වය හේතුවක් වූවාද යන්න විමර්ශනය කරන ලෙස පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලීමක් සිදුකර ඇත. මෙම පැමිණිලි විභාගය සඳහා පැමිණිලි පාර්ශවය නියෝජනය කරමින් ලංකා ගුරු සංගමය සහභාගී වූ අතර, වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු, මඩකලපුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ මෙම සිසුවා අධ්‍යාපනය හදාරන ලද විදුහලේ විදුහල්පතිවරයා ද සහභාගී විය. ඉදිරියේ දී මෙම සිද්ධියට මුහුණදුන් සිසුවාගේ දෙමාපියන් වෙතින් ද කරුණු විමසීමට තීරණය වූ අතර එම තොරතුරු ද පදනම් කරගෙන මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2022 දෙසැම්බර් 14